**මධ්‍යම පළාත් සභාව - 2013**

-------------------------------------

මධ්‍යම පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (අයිඑස්එස්ඒඅයි-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන

පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණකගේ සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය, ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 පළාත් සභා අරමුදල් ගිණුම

පළාත් සභා අරමුදල් ගිණුම 2014 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

### 2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2014 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුම් පිළිබඳ විස්තර | 2013 වර්ෂයට අදාල ගිණුම් | | |
|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| i. | වත්කම් හා බැරකම් ප්‍රකාශ | 01 | 01 | - |
| ii. | විසර්ජන ගිණුම් | 32 | 31 | 01 |
| iii. | ආදායම් ගිණුම් | 02 | 02 | - |
| iv. | පළාත් සභා නිලධාරීන්ට අත්තිතාකරම් ගිණුම | 66 | 65 | 01 |
| v. | වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 02 | 04 |
| vi. | අරමුදල් ගිණුම් | 01 | 01 | - |
| vii. | ප්‍රඥප්ති ගිණුම් | 03 | 02 | 01 |
| viii. | පළාත් සභා මන්ත්‍රී අත්තිකාරම් ගිණුම | 01 | 01 | - |
| | | 112 | 105 | 07 |

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.74,812,510 ක පොලී ආදායම් උපයාගෙන තිබුණු නමුත්, ආයෝජනයන් කිරීම පිළිබඳව හෝ පොලී ආදායම් ගිණුම්ගත කිරීම පිළිබඳව අනුගමනය කරන ලද ක්‍රමය ගිණුම් ප්‍රතිපත්ති මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) පළාත් සභාව ආරම්භයේ සිට මධ්‍යම රජය විසින් සහ පළාත් සභාව විසින් ස්ථාවර වත්කම් වෙනුවෙන් සැලකියයුතු වියදමක් දරා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා රු.10,252,017 ක වියදම් දරා තිබුණි. කෙසේ වුවද, ස්ථාවර වත්කම් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණු අතර, ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක : එස්එස්/ඒඑස්/ඒඒ දරන 2013 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාර 2013 වර්ෂයේ සිට වාර්ෂික ගිණුම් උපචිත පදනම යටතේ පිළියෙල කළයුතු වුවද, පළාත් සභාව ඊට අනුකූල වී නොතිබුණි.

2.2.4 ගණකාධිකරණ අඩුපාඩු

---------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.469,473,632 ක් වූ වත්කම් ශේෂ සමඟ රු.178,395,563 ක් වූ වගකීම් ශේෂ එකිනෙක හිලව් කර රු.291,078,069 ක් වූ ශුද්ධ වෙනස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී උපයාගෙන තිබුණු ආයෝජන පොලී ආදායම් වලින් රු.13,365,139 ක ප්‍රමාණයක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.2,650,795 ක් වූ හිඟ වාහන ආදායම් බලපත්‍ර ගාස්තුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිඟ ආදායම් ශේෂයට ඇතුළත් කර දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.43,240,437 ක හිඟ මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) විවිධ වගකීම් යටතේ වූ රු.2,463,666 ක ශේෂය තුළ ගල්පාලම ගොවිපල අත්තිකාරම් ගිණුමේ බීජ අර්තාපල් විකිණීමෙන් ලද රු.352,000 ක ආදායම දෙවරක් සටහන් වී තිබුණු අතර, එය නිරවුල් නොකර වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව යැවියයුතු රු.398,952,677 ක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණු නමුත්, ඉකුත් වර්ෂ 3 ට අදාල, එකතුව රු.1,459,872,807 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) වර්ෂය ආරම්භයේ හා අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ සකස් වූ ආකාරය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් මගින් දක්වා නොතිබුණි.

2.2.5 නොසැසඳුන පාලන ගිණුම්

-------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.745,164,130 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන සහ වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර, නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.464,579,254 ක් විය.

2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබියයුතු ගිණුම්

--------------------

i. ආයතන 5 ක් විසින් නොපියවන ලද එකතුව රු.46,892,180 ක් වූ අනුමත අත්තිකාරම් ශේෂ පියවීමට කටයුතු නොකර වර්ෂ ගණනාවක සිට ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පැවතුණි.

ii. වාණිජ අත්තිකාරම් සඳහා වූ ප්‍රාග්ධන දායකත්ව ගිණුම යටතේ මගී ප්‍රවාහන සේවා අධිකාරියට ලබාදී තිබුණු රු.1,677,540 ක මුදල නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

iii. පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් වසර 6 ක් තුළ ණය පදනම මත සිදුකර තිබුණු රෙදි අලෙවියෙන් රු.17,824,998 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

iv. මාතලේ කලාප අධ්‍යාපන කාර්යාලයට 2003 ඔක්තෝබර් මාසය සඳහා නිදහස් කළයුතු රු.200,000 ක අග්‍රිමය වෙනුවෙන් රු.2,000,000 ක අග්‍රිමයක් නිදහස් කිරීම හේතුවෙන් මුදල් හා අග්‍රිම ශේෂ අතර රු.1,800,000 ක වෙනසක් සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ගනුදෙනුව නිරවුල් කර ගෙන නොතිබුණි.

v. සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂවල එකතුව රු.1,134,299,984 ක් විය. දිගු කාලයක් තිස්සේ නිලධාරීන් 5,567 දෙනෙකුගෙන් අයනොවී පවතින එකතුව රු.140,422,261 ක් වූ ණය ශේෂද, ඊට ඇතුළත්වී තිබුණි.

vi. අන්තර් පළාත් සහ මධ්‍යම රජයේ මෙන්ම පළාතේ රාජ්‍ය ආයතන අතර ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබුණු කේවල ණය ශේෂවල එකතුව රු.5,666,659 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

පළාත් සභා 5 කින් ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් වෙනුවෙන් එම පළාත් සභාවලට ගෙවිය යුතු රු.588,312 ක ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) පනත් | |
| i. 2003 අංක 17 දරන පනත මගින් සංශෝධිත 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපල 03 ක සහ සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් අහිමි කම්කරුවන් 53 දෙනෙකු වෙනුවෙන් යැවිය යුතු රු.356,430 ක දායක මුදල අරමුදල වෙත යවා නොතිබුණි. |
| ii. 2011 අංක 22 හා 2013 අංක 18 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 120 හා 132(i) වගන්ති | මහනුවර සහ නුවරඑළිය යන දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 02 ක හා රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් 50 දෙනෙකුගෙන් සහ හෙදියන් 190 දෙනෙකුගෙන් 2013 වර්ෂය සඳහා පිළිවෙලින් රු.250,680 ක් හා රු.743,847 ක් වූ උපයන විට ගෙවීමේ බදු මුදල් අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය | නුවරඑළිය අධ්‍යාපන කලාපයේ ගුරුභවතුන් හතර දෙනෙකු නාවික හමුදාවට හා ශිෂ්‍යභට සේවයට මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රී වරයකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය සඳහා පිළිවෙලින් 1991, 2009 හා 2010 යන වර්ෂවලදී මුදාහැර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 71 වැනි රෙගුලාසිය | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත නොවූ විෂය අධ්‍යක්ෂ යන තනතුරක් සඳහා පත්වීම් 13 ක් ලබාදී 2013 වර්ෂයේදී ඔවුන්ට රු.6,673,417 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

(ඈ) පළාත් මූල්‍ය රීති
-------------------

| | | |
|---|---|---|
| i. | මූල්‍ය රීති 30.1 | ප්‍රතිපාදන සීමා ඉක්මවා වියදම් නොදැරිය යුතු වුවද ආයතන 9 ක් විසින් ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වැය විෂයයන් 22 ක් යටතේ දරා තිබූ රු.71,240,580 ක වියදම් සඳහා මධ්‍යම පළාත් මුදල් කළමනාකරණය විසින් පසුව අනුමැතිය ලබාදී තිබුණි. |
| ii. | මූල්‍ය රීති 54(6) | වර්ෂ 2003 සිට වර්ෂ 2011 දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 36 කට අදාලව කරන ලද පරීක්ෂණවල වාර්තා මඟින් මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සම්බන්ධ නිලධාරීන් 25 දෙනෙකුගෙන් අයකිරීමට තීරණය කර තිබූ රු.1,151,803 ක අධිභාර මුදල් 2014 ජූලි මස වන විටත් අයකර ගෙන නොතිබුණි. |
| iii. | අංක 54.1.1, 54.1.3, 54.1.5, 54.3.1, 54.4, 54.5 හා 54.6 දරන මූල්‍ය රීති | මධ්‍යම පළාත් සභාවේ සභාපතිවරයාගේ පරිහරණය සඳහා ලබාදී තිබූ අංක කේජී - 1326 දරන රථය 2013 සැප්තැම්බර් 18 දින පදියපැලැල්ලේදී අනතුරකට භාජනයවී තිබුණු නමුත් ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| iv. | මූල්‍ය රීති 138.1 | කොත්මලේ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් නිලධාරීන් දෙදෙනෙකු අත්සන් නොකළ රික්විසිෂන් පත්‍ර 14 ක් සඳහා රු.1,566,897 ක ගෙවීම් කර තිබුණි. |
| v. | මූල්‍ය රීති 177 | වියදම් සහතික කිරීමකින් තොරව නාවලපිටිය රෝහලේ රු.2,026,491 ක් වටිනා වවුචර් පත් 05 ක් සඳහා ගෙවීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| vi. | මුල්‍ය රීති 282.2 | බැංකු සැසඳුම් ප්‍රකාශයක නොසැසඳුනු අයිතමයන් නොතිබිය යුතු නමුත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ සෑම බැංකු සැසඳුම් ප්‍රකාශයකම රුපියල් මිලියන 1 සිට රු.මිලියන 2.2 දක්වා නොසැසඳීම් ඇතුළත්ව පැවතුණි. |
| vii. | මූල්‍ය රීති 482.2.1 | තොග මට්ටම් ප්‍රමාණවත් ලෙස පවත්වා ගැනීම සඳහා නිසි පරිදි තොග ඇනවුම් කිරීම සිදු කළ යුතු වුවද, ප්‍රධාන අමාත්‍යාංශය විසින් ඊට අනුකූල නොවී තොග රැස් කිරීම හේතුවෙන් අයිතම 24 කට අයත් භාණ්ඩ ඒකක 4,243 ක් විනාශ කිරීමට නිර්දේශ කර තිබුණි. |

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ
------------------------

| | | |
|---|---|---|
| i. | 2006 ජනවාරි 12 දිනැති අංක 2006/02 දරන චක්‍රලේඛය | පළමු ශ්‍රේණියේ සිට 5 වැනි ශ්‍රේණිය දක්වා පන්තියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව 40 කටත්, 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්තියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව 45 කටත් සීමා කර තිබියදීත්, ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ 2 වැනි ශ්‍රේණියේ සිට 5 වැනි ශ්‍රේණිය දක්වා පන්තිවල ළමුන් 169 දෙනෙකුගේද, 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණියේ දක්වා පන්තිවල ළමුන් 68 දෙනෙකුගේද අතිරික්තයක් විය. |
| ii. | 2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛය | ගුරු මාරු ප්‍රතිපත්තිය සැකසීමේදී පහසු පාසලක උපරිම සේවා කාලය වර්ෂ 8 ක්ද, වඩාත් පහසු පාසලක උපරිම සේවා කාලය වර්ෂ 6 ක්ද වශයෙන් දක්වා තිබුණද, වර්ෂ 11 සිට වර්ෂ 34 ක් දක්වා සේවා කාලයක් එකම පාසලේ සේවයේ යෙදෙන ගුරුභවතුන් සිටින බව නියැදි පරික්ෂණවලදී අනාවරණය විය. |

| | | |
|---|---|---|
| (ඊ) | 2006 ඔක්තෝබර් 30 දිනැති අංක 14/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 6 ඡේදය | මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් 2012 අගෝස්තු සිට 2013 නොවැම්බර් දක්වා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අයකර තිබුණු රු.4,094,481 ක දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය | 2013 වර්ෂයේදී මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් අවස්ථා 37 කදී ගෙවා තිබුණු එකතුව රු.1,125,691 ක් වූ එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා යවා නොතිබුණි. |
| (ඈ) | 1991 මාර්තු 26 දිනැති අංක 3/91 දරන මධ්‍යම පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය | විෂය අධ්‍යක්ෂවරු 17 දෙනෙකු විසින් ඉකුත් මාස 87 කට අදාල මාසික ඉදිරි වැඩ සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (එ) | මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2002 දෙසැම්බර් 04 දිනැති අංකඑච්ආර්ඩී/පීපී එම්/ 2002/30 දරන චක්‍රලේඛයේ 21.1 හා 24.1 ඡේද | මාතලේ කලාපයට අයත් පාසල් 120 ක රු.2,548,662 ක් හා නාඋල කලාපයට අයත් පාසල් 39 ක රු.1,631,656 ක් වූ ගුණාත්මක යෙදවුම් මුදල් 2013 දෙසැම්බර් 31 දිනට වියදම් නොකර ඉතිරිව පැවතුණි. |
| (ඒ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක 156 දරන 2012 පෙබරවාරි 16 දිනැති අයවැය චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවී 2014 වර්ෂය සඳහා දින පොත් 700 ක් හා ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම සඳහා රු.678,000 ක වියදම් දරා තිබුණි. |
| (ඔ) | 2012 ජනවාරි 08 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ප්‍රජාපාදක සංවිධාන හා සමිතිවල හැකියාව,පලපුරුද්ද සහ මූල්‍ය ශක්තිය පිළිබඳ සලකා නොබලා කර්මාන්ත අමාත්‍යාංශය විසින් එකතු වටිනාකම රු.7,416,567 ක් වූ කර්මාන්ත 14 කට අයත් කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඕ) | 2013 ජනවාරි 07 දිනැති අංක 02-07/2013 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ | මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්යාල සේවයේ නියුතු නිලධාරීන් 10 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මාස 09 ක කාල පරිච්ඡේදය සඳහා විවේක කාල රාජකාරි බාධා, ප්‍රවාහන හා පැමිණ සිටීමේ මාසික දීමනා වෙනුවෙන් රු.1,720,000 ක මුදලක් ගෙවා තිබුණි. |

2.2.8 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු
-------------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක පීඊඩී/58(2) හා 2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ පළාත් මුල්‍ය රීති 562 ප්‍රකාර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගෙන යොමුගත චක්‍රලේඛ විධිවිධාන පළාත් සභාවට අදාළ කර නොගෙන මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපතිවරයාට මසකට රු.50,000ක් බැගින් මාස 08ක් සඳහා රු.400,000ක සභාපති දීමනා ගෙවා තිබුණි.

(ආ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාර මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත අනුයුක්ත කර ඇති අංක පීඊ 1938 දරන වාහනය සඳහා අනුමත සීමාව ඉක්මවා රු.50,016 ක පෙට්‍රල් ලීටර් 325 ක් ලබාදී තිබුණි.

(ඇ) 2003 දෙසැම්බර් 02 දිනැති අංක 04/03 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ vi ඡේදය ප්‍රකාර අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්, සහකාර ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ යන නිලධාරීන් විසින් කලාප අධ්‍යාපන කාර්යාල 11 ක සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු 116 ක් සඳහා පත්වීම් ලබාදී තිබුණි.

3. ආදායම් කළමනාකරණය
------------------------------

3.1 ආදායම් ශීර්ෂ අංක ම 10 හා ම 20 - ප්‍රධාන ලේකම්
----------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක තක්සේරුගත හා රැස්කරන ලද බදු ආදායම් සැලකීමේදී 2011 වර්ෂය හැර අනෙකුත් සෑම වසරකම රැස්කළ ආදායමේ රු.මිලියන 363 සිට රු.මිලියන 950 දක්වා පරාසයක ආදායම් අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බදු හා බදු නොවන ආදායම්වල සියයට 6.48 ක අඩුවීමක්ද, ආදායම් ඌණතාවයේ සියයට 17.68 ක වැඩිවීමක්ද, සමස්ත අයවැය ඌණතාවයේ සියයට 14.99 ක වැඩිවීමක්ද සිදුවී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

i. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බදු හා බදු නොවන ආදායම්වල රු.314,739,584 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

ii. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් ඌණතාවයේ රු.2,324,862,316 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

(ඇ) 2011 වර්ෂයේ අවසානයට රු.2,531,311,627 ක් වූ පළාත් සභා අරමුදලේ සමුච්චිත ශේෂය 2012 වර්ෂයේ අවසානයට රු.1,743,569,275 ක් දක්වා රු.787,742,352 කින්ද, සමාලෝචිත වර්ෂය අවසානයට එම අගය රු.1,514,217,234 ක් දක්වා රු.229,352,041 කින්ද අඩුවී ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) අවසන් ගිණුමට අනුව මෝටර් වාහන බලපත්‍ර හිඟ ආදායම් ශේෂවල එකතුව රු.86,916,067 ක් වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36 කින් බැහැරට මාරුවී තිබූ වාහන පිළිබඳ තොරතුරු ද එම ශේෂයට ඇතුළත්වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේදී මුද්දර බදු ආදායම් ලෙස මුදල් කළමනාකරණ අංශය වෙත ප්‍රේෂණය කර තිබූ රු.862,749,670 ක මුදලින් රු.173,311,390 ක් අදාල පළාත් පාලන ආයතන වෙත බෙදානොහැර අතරදවාගෙන තිබුණි.

4. මූල්‍ය සමාලෝචනය
------------------------

4.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.18,751,665,970 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.16,306,626,289 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,445,039,681 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

4.2 ව්‍යුහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

(අ) මුළු ආදායමට අතිරික්තය/ (ඌනතාවය)
------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වසර 02 ක කාලපරිච්ඡේදය තුළ සියයට 322 සිට සියයට 413 දක්වා පරාසයකින් ආදායම් ඌනතාවයේ අඛණ්ඩ වර්ධනයක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) මුළු ආදායම සහ මුළු වියදම අතර අනුපාතය
-------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

i. 2011 වර්ෂයේ රු.19,540,855,678 ක් වූ මුළු වියදම 2013 වර්ෂයේදී රු.23,292,216,013 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර, එය සියයට 422 සිට සියයට 513 ක් දක්වා ඉහළ අගයක් ගෙන තිබුණි.

ii. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී මුළු ආදායමේ අඩුවීම රු.314,739,584 ක් වූ අතර, 2011 වර්ෂයට සාපේක්ෂව එම අඩුවීම රු.85,888,069 ක් විය.

iii. මුළු ආදායමට සාපේක්ෂව මුළු වියදම සැලකීමේදී ආදායමේ වර්ධනයට වඩා වියදමේ සැලකියයුතු වර්ධනයක් සිදුවී ඇති බව පෙන්නුම් කෙරේ.

4.3 අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්
------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. ඇස්තමේන්තුගත බදු ආදායම් ඉලක්කය රු.මිලියන 950.3 කින් හෙවත් සියයට 19.8 කින් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබුණි.

ii. වියදම් ශීර්ෂ 4 හි ඇස්තමේන්තුගත සීමාවන්ට වඩා තථ්‍ය වියදම් රු.මිලියන 934.2 ක් අඩුවෙන් දැක්වුණි.

iii. අපේක්ෂිත රජයේ මූලධන ප්‍රදාන රු.මිලියන 1,208 කින් හෙවත් සියයට 26.9 කින් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබුණි.

iv. සමාලෝචිත වර්ෂය සඳහා අපේක්ෂා කළ ආදායම් ඌණතාවය රු.මිලියන 213.8 කින් අඩුවී තිබුණි.

මුදල් රෙගුලාසි 50(ii) සහ පළාත් මූල්‍ය රීති 7.2.1 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාර ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර ඉහත දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් සිදුවී ඇති බව පෙන්නුම් කෙරේ.

5. අධිකාරී ගිණුම්/ අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්

5.1 අධිකාරි ගිණුම්/ අරමුදල් ගිණුම්

මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

ප්‍රධාන විගණන නිරීක්ෂණ

(අ) ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

i. මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් භාවිතයේ පැවතියද, ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

ii. රු.3,964,490 ක් වූ වාහන කල්බදු වාරික ගෙවීම් වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

iii. මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යන්ත්‍ර කුලියට දීමෙන් උපයාගෙන තිබුණු ආදායම් රු.3,600,132 ක් අඩුවෙන්ද, වාහන අලුත්වැඩියා කිරීමෙන් උපයාගෙන තිබුණු ආදායම් රු.3,541,387ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

iv. පළාත් නිශ්චිත සංවර්ධන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ ලැබී තිබුණු රු.530,632,193ක මුදල සහ ඉන් මාර්ග නඩත්තු සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් දරා තිබුණු රු.505,728,896ක වියදම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) නීති, රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම
-------------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

i. ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 31.16 ඡේදයට පටහැනිව අල්ලස් ලබා ගැනීමේ චෝදනාවක් මත අනිවාර්ය නිවාඩු යවන ලද මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපතිවරයා අවිධිමත් ලෙස නැවත සේවයේ පිහිටුවා රු.1,141,090 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

ii. 2000 අංක 01 දරන මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තියේ 21 වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා නොගෙන නිලධාරීන් 28 දෙනෙකු බඳවාගෙන ඔවුන්ට රු.2,602,201ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

iii. මාර්ග සංවර්ධන අධිකාරියේ වසර දෙකක කාලයක් ඉක්මවා තිබුණු එකතු වටිනාකම රු.155,592,930 ක් වූ පොදු තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) මගී ප්‍රවාහන සේවා අධිකාරියට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි
-------------------------------------------------------------------------------

බාහිර පුද්ගලයන් දෙදෙනෙකු විසින් බලපත්‍ර නිකුත් කිරීමට හා අවලංගු කිරීමට එරෙහිව රු.65,000,000 ක වන්දි ඉල්ලා අධිකාරියට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

(ඇ) හඳුනාගන්නා ලද පාඩු

දෙල්තොට හා නාවුල කඩ කාමර බදුදීම සඳහා 2012 සැප්තැම්බර් මස සිට අවස්ථා 03 කදී රු.49,392ක වියදමින් ප්‍රසම්පාදන කැඳවා තිබුණද, සුදුසු ලංසු කරුවන් තෝරා ගැනීමට අපොහොසත් වීම නිසා 2012 දෙසැම්බර් මස සිට 2014 ජනවාරි මස දක්වා අධිකාරියට රු.1,008,000ක ආදායම් අහිමිවී තිබුණි.

(ඉ) ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

i. මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක්, ක්‍රියාකාරී සැලැස්මක් හා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

ii. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් මෙන්ම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු නමුත් අවස්ථා 34 කදී සීමිත මිල කැඳවීම් යටතේ රු.52,787,935 ක වියදමින් මාර්ග ඉදිකර තිබුණි.

(ඊ) ලැබිය යුතු ගිණුම්

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බාහිර ව්‍යාපෘති 04ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සහ අත්තිකාරම් වශයෙන් දෙන ලද එකතුව රු.10,322,448 ක මුදලක් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

## 5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

### 5.2.1 පේෂකර්ම දෙපාර්තමේන්තුවේ වාණිජ අත්තිකාරම් ගිණුම

පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළ 2013 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අගෝස්තු 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

5.2.2 හැටන් සම්පත් මධ්‍යස්ථානයේ වාණිජ අත්තිකාරම් ගිණුම
------------------------------------------------------------

(අ) ප්‍රධාන විගණන නිරීක්ෂණ
------------------------------

i. බලයලත් සීමා නොපිළිපැදීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ විසර්ජන ප්‍රඥප්තියෙන් බලයදී තිබුණු ලැබීම්වල අවම සීමාව රු.1,760,000 ක් වුවත්, ලභාවී තිබුණු සීමාව රු.1,580,775 ක් පමණක් වූයෙන් ඇස්තමේන්තු සීමාවට වඩා රු.179,245 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

ii. 2012 වර්ෂයේ ශුද්ධ අතිරික්තය මුළු ආදායමින් සියයට 43.73 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී එය සියයට 2.81 ක සෘණ අගයක් ගෙන තිබුණි.

iii. ඉකුත් වර්ෂයේදී මුළු වියදම මුළු ආදායමින් සියයට 56 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දී එම අගය සියයට 102.8 ක් දක්වා වැඩිවී තිබුණි.

5.2.3 මාපනාවතුර සම්පත් මධ්‍යස්ථාන වාණිජ අත්තිකාරම් ගිණුම
------------------------------------------------------------

(අ) ප්‍රධාන විගණන නිරීක්ෂණ
------------------------------

i. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,754,824 ක් හෙවත් සියයට 187 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

ii. ඉකුත් වර්ෂයේ සියයට 73 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණු මෙහෙයුම් ආදායමට ශුද්ධ අතිරික්තය සමාලෝචිත වර්ෂයේදී සියයට 2,513 ක පිරිහීමක් බවට පරිවර්තනය වී තිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ පාඨමාලා පවත්වා ගෙනයාම සඳහා අනුමත කරන ලද රු.මි.4.139 ක මුදලින් රු.මිලියන 0.67 ක් හෙවත් සියයට 16 ක් පමණක් ලැබී තිබුණි.

iv. ඉකුත් වර්ෂ දෙකේදී සහ සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා 14 ක් සඳහා බඳවා ගෙන තිබුණු ආධුනිකයින්ගෙන් පිළිවෙලින් සියයට 42 ක්, සියයට 46 ක් හා සියයට 53 ක් පාඨමාලා හැර ගොස් තිබුණි.

5.2.4 ගල්පාලම ගොවිපල වාණිජ අත්තිකාරම් ගිණුම
---------------------------------------------------------

(අ) ප්‍රධාන විගණන නිරීක්ෂණ
--------------------------------

i. 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු.9,369,914ක් විය යුතු වුවද, ශේෂ පත්‍රයේ එම අගය රු. 1,279,183 ක සෘණ අගයක් ලෙස දැක්වීම හේතුවෙන් රු.10,649,097 ක වෙනසක් අනාවරණය විය.

ii. පළාත් මූල්‍ය රීති 307.1 අනුව පළාත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ දෙපාර්තමේන්තු ගිණුම් මාසිකව නොසැසඳීම නිසා එම ශේෂ අතර රු.843,750ක වෙනසක් නිරීක්ෂණය විය.

iii. ඉකුත් වර්ෂයේ සියයට 79 ක් වූ දල ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 33 ක් තරම් පහළ අගයක් ගෙන තිබුණි.

5.2.5 මධ්‍යම පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය අංක 582202 දරන නිෂ්පාදන හා විකුණුම් පිළිබඳ අත්තිකාරම් ගිණුම
---------------------------------------------------------------------------------------------------

(අ) ප්‍රධාන විගණන නිරීක්ෂණ
--------------------------------

i. නොසැසඳුනු පාලන ගිණුම්
--------------------------------

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව රු.284,459,055ක ශේෂයක් මධ්‍යම පළාත් සභා අරමුදල නමින් හිමිකම් හා වගකීම් යටතේ දක්වා ඇතත්, මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එම ශේෂය රු.35,856,384ක් ලෙස දැක් වූයෙන් ශේෂ අතර රු.248,602,671ක වෙනසක් විය.

ii. ඇස්තමේන්තු සීමා පිළිනොපැදීම
--------------------------------------

මුල්‍ය රීති 369.4 ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා සීමාවන් ඉක්මවීම/ පහත වැටීම වලකා ලීමට කටයුතු කරන ලෙස දෙපාර්තමේන්තුවට තරයේ නියම කර තිබුණද, ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද ඊට අනුකූල නොවී 2013 දෙසැම්බර් 31 දින අවම බැර සීමාව රු.9,000,000 සිට රු.6,500,000 දක්වා අඩුකරගෙන තිබුණි.

iii. ආධුනිකයින් පාඨමාලා හැරයාම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ බඳවා ගත් ආධුනිකයන් 365 දෙනාගෙන් 128 දෙනෙකු පාඨමාලා හැර ගොස් තිබුණු අතර ඉකුත් වර්ෂයේදී එම සංඛ්‍යාව 100 ක් වී තිබුණි. කෙසේ වුවද, පාඨමාලා හැරයන සංඛ්‍යාව අවම කර ගැනීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

6. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

6.1 කාර්ය සාධනය
------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන වැඩසටහන් යටතේ මගී ප්‍රවාහනය සඳහා රුපියල් මිලියන 21ක් වෙන් කර තිබුණද, ඉන් රුපියල් මිලියන 7.95ක ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කර තිබුණි. වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 13.05ක් එනම් සියයට 62.14ක ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) මාර්ග වැඩසටහන යටතේ 2013 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීමේදී මාර්ග දුර කිලෝමීටර් 1,269 ක් පවතින මහනුවර දිස්ත්‍රික්කයට එකී කිලෝමීටර ප්‍රමාණයට සාපේක්ෂව සියයට 9.4 ක අඩු ප්‍රතිපාදන සහ කිලෝමීටර් 480 ක් පවතින මාතලේ දිස්ත්‍රික්කයට සියයට 27.2 ක් වැනි ඉහල ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඇ) ජේඅයිසීඒ ව්‍යාපෘතිය යටතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 1,247 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, වර්ෂය අවසානය වන විට කිසිදු ව්‍යාපෘතියක් නිම කර නොතිබුණි.

(ඇ) ඊඑන්ඩීආර්පී ව්‍යාපෘතිය යටතේ වූ සියලු ඉදි කිරීම් කටයුතු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නිම කළ යුතුව තිබුණද රුපියල් මිලියන 730 ක ප්‍රතිපාදන මත ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 15ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිම කර නොතිබුණි.

(ඉ) විකල්ප බලශක්ති වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 2 ක වියදම් දරා නිම කිරීමට අපේක්ෂා කර තිබුණු කුණ්ඩසාලේ ජීව වායු ඒකකය වර්ෂය අවසාන වන විටත් නිම කර නොතිබුණි.

(ඊ) ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වූ දෙපාර්තමේන්තු ප්‍රවාහන ප්‍රඥප්තිය 2013 වර්ෂය අවසාන වන විටත් අනුමත කරවාගෙන නොතිබුණි.

(උ) පළාත් රාජ්‍ය සේවා කොමිෂම විසින් 2013 වර්ෂයේදී බඳවාගැනීමේ, උසස් කිරීම්/ ස්ථිර කිරීම හා කාර්යක්ෂමතා කඩඉම් සඳහා විභාග ඇතුළු විභාග 11 ක් පැවැත්වීම සඳහා අයදුම් පත්‍ර කැඳවීම, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද, එකී අරමුණු ඉටුකර ගැනීමට සමත් වී නොතිබුණි.

(ඌ) ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලාවල 2013 වර්ෂයට අදාළ ඖෂධ අවශ්‍යතාවයන් හඳුනාගෙන නිෂ්පාදනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණු ඖෂධ වර්ග 45 ක් නිෂ්පාදනය කර නොතිබුණි.

(එ) පාසැල් විභාග ප්‍රතිඵල
-------------------------

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ වූ සිසු දරුවන්ගේ අධ්‍යාපන ප්‍රතිඵල සම්බන්ධයෙන් කරන ලද සෝදිසි පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය වී ඇත.

i. 5 වසර ශිෂ්‍යත්ව විභාගය
----------------------------

* මධ්‍යම පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 15 ට අයත් පාසල් 1516 කින් 2013 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා සිසුන් 43192 ක් ඉදිරිපත් වී තිබුණි. ඉන් සිසුන් 2947 දෙනෙකු කඩඉම් ලකුණු ඉක්මවා ලකුණු ලබා ගෙන තිබුණු අතර එය විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාවෙන් සියයට 7 කට වඩා අඩු අගයක් විය.

* එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 35 බැගින් ප්‍රශ්න පත්‍ර දෙක සඳහා ලකුණු 70 ක් ලබාගෙන විභාගය සමත් වී තිබුණු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 27973 ක් විය.

* දිවයිනේ සමස්ථ ප්‍රතිඵල අතුරින් මධ්‍යම පළාතට 7 වන ස්ථානය හිමිවී තිබූ අතර, කඩඉම් ලකුණු අනුව සමත් සංඛ්‍යාව සැලකූ විට මධ්‍යම පළාතට දිවයිනේ අවසාන ස්ථානය හිමිවී තිබුණි.

* දිස්ත්‍රික් මට්ටමෙන් සමස්ථ ප්‍රතිඵල සලකා බැලීමේදී මහනුවර, මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්ක පිළිවෙලින් 22, 24 හා 25 වන ස්ථාන හිමිකර ගෙන තිබුණි.

ii. අ.පො.ස (සා.පෙළ) විභාගය

* 2013 වර්ෂයේ අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා මධ්‍යම පළාතේ පාසල් 919 කින් සිසුන් 34,455 ක් ඉදිරිපත් වී තිබුණු අතර, ඉන් අ.පො.ස (උ.පෙළ) හැදෑරීම සඳහා 21,878 දෙනෙකු සුදුසුකම් ලබා තිබුණි. එම සංඛ්‍යාව විභාගයට ඉදිරිපත් වූ සිසුන්ගෙන් සියයට 63.5 ක් විය. දිවයිනේ සමස්ත ප්‍රතිඵල අතුරින් මධ්‍යම පළාතට 07 වන ස්ථානය හිමිවී තිබුණි.

* අ.පො.ස(සා.පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ සිසුන්ගෙන් 712 දෙනෙකු සියළුම විෂයයන් සඳහා ‘ඒ’ සාමාර්ථ ලබාගෙන තිබුණු නමුත්, එම අගය විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් සියයට 2 ක අගයක් විය.

* විභාගයට ඉදිරිපත් වූ සිසුන්ගෙන් 1361 දෙනෙකු සියළුම විෂයයන් අසමත් වී තිබුණු අතර, එම අගය සියයට 3.95 ක් විය.

* අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ සිසුන්ගෙන් ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව වැනි අනිවාර්ය විෂයයන් අසමත් සංඛ්‍යාව ඉහල අගයක් ගෙන තිබුණි.

| විෂයය | ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව | අසමත් සිසුන් සංඛ්‍යාව | අසමත් ප්‍රතිශතය % |
|---|---|---|---|
| ඉංග්‍රීසි | 34,380 | 18,527 | 53.88 |
| ගණිතය | 34,373 | 16,431 | 47.80 |
| විද්‍යාව | 34,390 | 12,912 | 37.54 |

iii. අ.පො.ස (උ.පෙළ) විභාගය
-------------------------------

* 2013 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා මධ්‍යම පළාතේ පාසල් 428 කින් සිසුන් 26,697 දෙනෙකු ඉදිරිපත් වී තිබුණු අතර, ඔවුන්ගෙන් 15,148 දෙනෙකු විෂයයන් තුනම සමත් වී තිබුණි. එම අගය විභාගයට ඉදිරිපත් වූ මුළු සිසුන්ගෙන් සියයට 56.74 ක් විය. පළාත් 09 හි සමස්ථ ප්‍රතිඵල සැසඳීමේදී මධ්‍යම පළාතට 07 වන ස්ථානය හිමිවී තිබුණි.

* සිසුන් 424 දෙනෙකු විෂයයන් තුන සඳහා ‘ඒ’ සාමාර්ථ ලබාගෙන තිබුණු නමුත්, එම සංඛ්‍යාව විභාගයට ඉදිරිපත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 1.59 ක් තරම් පහළ අගයක් විය.

* සිසුන් 3,053 දෙනෙකු සියළුම විෂයයන් අසමත් වී තිබුණු අතර, එම අගය විභාගයට ඉදිරිපත් වූ සංඛ්‍යාවෙන් සියයට 11.44 ක් විය.

* 2013 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ සිසුන්ගෙන් 15,148 දෙනෙකු විවිධ විෂයධාරාවන් යටතේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබුණි. ඒ පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| විෂයධාරාව | ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව | විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | අසමත් සංඛ්‍යාව |
|---|---|---|---|
| ජීව විද්‍යා | 4,117 | 1,879 | 2238 |
| භෞතික විද්‍යා | 2,891 | 1,330 | 1561 |
| වාණිජ | 7,401 | 4,013 | 3388 |
| කලා | 12,112 | 7,822 | 4290 |
| වෙනත් | 176 | 104 | 72 |
| | 26,697 | 15,148 | 11,549 |

* විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සලකා බැලීමේදී ජීව විද්‍යා හා භෞතික විද්‍යා අංශයේ ප්‍රතිඵල සියයට 50 කටත් වඩා අඩු මට්ටමක පවතින බව අනාවරණය විය.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ණය අරමුදලක් ගොඩනැගීම සඳහා නිවාස දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කළ රු.11,250,000ක මුදල එතැන් සිට 2012 වර්ෂය දක්වා අදාළ කාර්යයට යොදවා නොගෙන ඌන උපයෝජිතව පැවතීම හේතුවෙන් රු.3,150,000ක පොලී ආදායම් අහිමි වී තිබුණි.

(ආ) 2013 මාර්තු 20 දින නිවාස කොමසාරිස් විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග එළඹි නව ගිවිසුම අනුව එදින සිට මාස 06ක් ඇතුළත ප්‍රතිලාභීන් 300කට ණය ලබාදීමට බැංකුව විසින් එකඟ වී තිබුණද, 2013 දෙසැම්බර් 31 වන විට ප්‍රතිලාභීන් 90 දෙනෙකුට පමණක් රු.4,480,000ක ණය ලබා දී තිබුණි.

(ඇ) නිවාස දෙපාර්තමේන්තුව මඟින් සෘජු ණය ලබාදීම හා හිඟ ශේෂයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ණය ක්‍රමය | ණය අයවිය යුතු පුද්ගල සංඛ්‍යාව | අය නොවී පවතින වර්ෂ ගණන | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින හිඟය |
|---|---|---|---|
| | | | රු. |
| නිවාස ණය | - | 17 | 3,198,741 |
| සමූපකාර ණය දෙන සමිති | 179 | 20 | 952,643 |
| විවිධ සේවා සමූපකාර සමිති | 347 | 21 | 1,979,849 |

(ඈ) ප්‍රධාන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු 03 කට අයත් දේපලවලට අවස්ථා 15 කදී සිදුවී තිබුණු එකතුව රු.31,834,853 ක් වූ හානි හා පාඩු පිළිබඳව ක්‍රියා නොකර වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන නමුත්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා එම කටයුතු අවසන් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2013 මාර්තු සිට ඔක්තෝබර් මස දක්වා වූ මාස 08 ක කාලය තුළ සේවක වැටුප්වලින් අයකර ගෙන තිබුණු එකතුව රු.379,639 ක මුද්දර ගාස්තු, අග්‍රහාර දායක මුදල් සහ සුභසාධන සංගම් සඳහා අයකළ මුදල් අදාළ ආයතනවලට නොයවා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූලා අවශ්‍යතා සඳහා යොදවාගෙන තිබුණි.

(ඊ) දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක පිහිටුවා තිබුණද, 2013 නොවැම්බර් මස වන විටත් මෙම ඉඩම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) දඹුල්ල වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මූලික රෝහල් පරිශ්‍රය තුළ සිදුකර ඇති අනවසර ඉදිකිරීම් දෙකක් සම්බන්ධව ශ්‍රී ලංකා පොලීසිය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර තිබුණු නමුත්, ඒ පිළිබඳව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට සෞඛ්‍ය බලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ඌ) මාස 02 සිට මාස 19 දක්වා කාල පරාසයක් තුළ වර්ග 34 ක ඖෂධ තොග හිඟව පැවතීම නිසා ප්‍රතිකාර ලබා ගැනීමට දිනපතා පැමිණෙන රෝගීන්ට විශ්වාසදායී තෘප්තිමත් ආයුර්වේද සේවාවක් ලබාදීමට නොහැකි වී තිබුණි.

(එ) 2013 නොවැම්බර් මස මිලදී ගෙන තිබුණු රු.5,913,550 ක් වටිනා දිළිඳු, අසරණ සහ ආබාධිත පුද්ගලයින්ට බෙදාහැරීම සඳහා ඇස්කණ්ණාඩි, ශ්‍රවණ උපකරණ, අත්වාරු, කිහිලිකරු සහ රෝද පුටු විගණන දිනය වූ 2014 පෙබරවාරි 07 දින වනවිටත්, සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ පුද්ගලයන් වෙත නිකුත් නොකර ගබඩාවේ රඳවා තිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඖෂධ ගබඩා 3 ක රු.10,198,275 ක් වටිනා කල් ඉකුත් වූ ඖෂධ අයිතම 358 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි ඖෂධ වර්ග 15 ක් සහ එන්නත් වර්ගයක්ද විය.

(ආ) නාවලපිටිය රෝහලේ එක්ස් කිරණ යන්ත්‍රය සඳහා 2012 දෙසැම්බර් 31 දින මිලදී ගෙන තිබුණු රු.151,200 ක් වටිනා Led glass උපකරණ 2014 මාර්තු 18 දින වන විටත් භාවිතයට යොදවා නොගෙන නිශ්ක්‍රීයව පවතින බව දක්නට ලැබුණි.

(ඇ) සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු රු.1,159,443 ක් වටිනා ඖෂධ වර්ග 685 ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව ගබඩා කර තිබුණි.

(ඈ) මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පාලනය වන වෛද්‍ය සැපයුම් අංශයේ 2013 වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුළත්ව තිබුණු රු.2,504,363 ක් වටිනා ඖෂධ වර්ග 09 ක් හා ඊ.සී.ජී.රෙකෝඩින් පේපර් රෝල් 9465 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාවට ලැබී නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේදී නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය, නුගවෙල පිරිමි විදුහල හා නුගවෙල බාලිකා විද්‍යාලය ඒකාබද්ධ කර ශක්තිමත් ජාතික පාසලක් හා මිශ්‍ර පාසලක් පිහිටුවීමේ අරමුණෙන් ස්ථාන මාරුවීම් ලබාදෙන තෙක් නුගවෙල බාලිකා විද්‍යාලයේ ගුරුභවතුන් 78 දෙනෙකු නුගවෙල මධ්‍ය මහා විද්‍යාලය වෙත අනුයුක්ත කර තිබුණි. එම ගුරුභවතුන් වෙනුවෙන් 2013 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලයට අදාලව රු.16,951,279 ක් වැටුප් වශයෙන් මධ්‍යම පළාත් සභා වැය ශීර්ෂය යටතේ ගෙවා තිබුණු නමුත් එම ගුරුභවතුන්ට මධ්‍යම රජය යටතේ පත්වීම් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මහවැලි අධිකාරියට අයත් ඉඩමක් පවරා නොගෙන කොත්මලේ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් එහි වර්ග අඩි 4000 ක ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

(උ) කටුගස්තොට කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ සේවය කරන පළාත් සභා ගුරුභවතුන් 229 දෙනෙකුද, ජාතික පාසැල්වල ගුරුභවතුන් 28 දෙනෙකු හා පිරිවෙන්වල සේවයේ නියුතු ගිහි හා පැවිදි ගුරුවරුන් 22 දෙනෙකුද වශයෙන් එකතුව 279 දෙනෙකු වූ ගුරුභවතුන්හට 2009 සිට 2011 වර්ෂය දක්වා වූ කාලයට අදාළව ඔවුන්ට හිමි රු.15,019,016 ක හිඟ වැටුප් ගෙවා නොතිබුණි.

(ඌ) මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ 2004 ජුලි 08 දිනැති අංක සීපීසී/එම්ඊ/ඩීඊ/6/සීඩා/1 දරන ලිපිය ප්‍රකාරව හැටන් කලාපයේ පාසැලක නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු සේවා අවශ්‍යතා මත බව සඳහන් කරමින් හැටන් සීඩා අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ නිලධාරී තනතුරට දීර්ඝ කාලීනව මුදාහැර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.3,584,140 ක් ගෙවා තිබුණි.

(එ) 2013 තෙවැනි කාර්තුවේ ගුණාත්මක යෙදවුම් වෙනුවෙන් හැටන් අධ්‍යාපන කාර්යාලයට ලැබී තිබුණු රු.5,650,500 ක මුදලින් රු.1,613,985 ක් හෙවත් සියයට 28 ක් පමණක් වියදම් දරා තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට රු.3,708.128 ක මුදලක් ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව රඳවාගෙන පැවතුණි.

(ඒ) හැටන් කලාපයට අයත් පාසැල් පිහිටා ඇති ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සිදු කර නොතිබුණි. පාසැල් 143 ක ඉඩම් තක්සේරු කර නීතිමය පවරා ගැනීම් සඳහා ඊට අදාළ තොරතුරු සහ ලිපිගොනු 2013 මාර්තු 22 දින පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත එවා තිබුණද, වර්ෂය අවසන් වන විටත් ඒවායේ ඉදිරි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඔ) මධ්‍යම පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 08 ක සේවයේ නියුතු නිලධාරීන් 08 දෙනෙකු පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලවල සේවය සඳහා නිදහස් කර තිබුණු අතර, ඉන් 06 දෙනෙකුට අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණු රු.766,429 ක මුදල පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූර්ණය කර ගැනීමට 2014 අගෝස්තු 13 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඕ) උඩදුම්බර සිද්ධාර්ථ ප්‍රාථමික විද්‍යාලය ආරම්භ කිරීම සඳහා බ්‍රෝඩ්වේ ඇපරල් ආයතනය සතු දේපල මිලදී ගැනීම සඳහා 2010 දෙසැම්බර් 31 දින ගෙවා තිබූ රු.20,000,000 ක මුදල උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. තෙල්දෙණිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2012 ජූනි 26 දින මෙම ඉඩමේ භුක්තිය බාරගෙන තිබුණු නමුත් 2013 දෙසැම්බර් 31 දින වනවිටත් අදාල ඉඩම මිලදී ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ක) ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුමට අදාල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ශේෂය රු.1,969,736 ක සෘණ අගයක් විය. එම ශේෂය නිරවුල් කිරීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රමාද වෙමින් පැවතුණි.

(ග) ඉකුත් වර්ෂවල සිට පොදු තැන්පත් ගිණුමේ දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පවතින පහත විස්තර දැක්වෙන ශේෂයන් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

| විස්තරය | මුදල |
|---|---|
| ---------- | ------ |
| | රු. |
| පළාත් භාණ්ඩාගාරය | (162,086,816) |
| ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 1,178,613 |
| පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | (54,878,270) |

6.4 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම
--------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කළ යුතු බවට හඳුනාගෙන තිබුණ කිලෝමීටර් 1,197ක් වූ මාර්ග වලින් ඍජු ශ්‍රම පදනම මත නඩත්තු කර තිබුණේ කිලෝමීටර් 39ක මාර්ග පමණි. එය අපේක්ෂා කළ ප්‍රමාණයෙන් සියයට 3.25ක් විය.

(ආ) අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තිය ප්‍රකාරව අධිකාරිය විසින් ගැසට් කරනු ලබන මාර්ග පමණක් නඩත්තු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියට අයත් නොවන ප්‍රාදේශීය සභා සතු මාර්ග 09ක නඩත්තු කටයුතු කිරීම සඳහා රු.34,115,083ක වියදම් දරා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ රු.11,010,745ක වියදමින් ටිබර්ටන් මුරුත්තැන්න හඟරාපිටිය මාර්ගයේ වැඩ නිම කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත් කාලයද අවසන් වී මාස 02කට පසුව වැඩ ආරම්භ කර තිබුණු බැවින් නියමිත කාලය තුළ කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කරවා ගැනීමට සාධාරණ උත්සාහයක් දරා නොමැති බව නිරික්ෂණය විය.

(ඈ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණික ඇගයීම් කමිටු වලට පත් කර තිබුණු සමහර නිලධාරීන් එකී ඇගයීම් කමිටු රැස්වීම් සඳහා සහභාගි නොවූ බවට තහවුරු වී තිබීම හේතුවෙන් අවස්ථා 10කදී ප්‍රදානය කර තිබුණු එකතු වටිනාකම රු.85,072,917ක් වූ කර්මාන්ත වල ඇගයීම් කමිටු වාර්තා සමඟ එකඟවීමට විගණනයේදී නොහැකි විය.

(ඉ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිකළ කොස්වාන ගන්සරපොල මාර්ගයේ ඇස්ෆෝල්ට් අතුරා තද කළ පසු ඝනකම මි.මී. 40ක් විය යුතු වුවද, පරික්ෂා කරන ලද ස්ථාන 09කම ඝනකම මි.මී.18ත් මි.මී.25ත් අතර වූයෙන් මාර්ගය නියමිත ඝනකමින් යුක්ත වන ආකාරයට නිම කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) ඇස්ෆෝල්ට් ඝන මීටර් 3230ක් යෙදිය යුතු මාර්ග තලයට ඝන මීටර් 2780ක් පමණක් යෙදීම නිසා රු.631,588ක් වටිනා ඇස්ෆෝල්ට් ඝන මීටර් 450ක් මාර්ගයට යොදා නොතිබුණු බව නිරීක්ෂණය විය.

6.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් කාර්ය නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ අධ්‍යාපන සංවර්ධනය සඳහා 2013 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු මඟින් ඒකාබද්ධ අරමුදල යටතේ ප්‍රතිපාදිත රු.128,000,000 ක මුදලින් එකී අරමුණට අදාල නොවන කාර්යයන් සඳහා අවස්ථා 58 කදී රු.4,489,930 ක වියදම් දරා තිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණු වාරිකර්මාන්ත වලට අදාලව 2014 පෙබරවාරි සහ මාර්තු යන මාස වලදී කරන ලද නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ විස්තර පහත දැක්වේ.

i. රු.542,050 ක වියදමින් ප්‍රතිසංස්කරණය කර තිබුණු වලපනේ, වටරක්ගොඩ ඇළෙහි පැරණි ඉදිකිරීම් තුළින් තවදුරටත් ජලය කාන්දුවීම සහ අපතේ යාම සිදු වෙමින් තිබුණි.

ii. කොත්මලේ කඩුපුල්ඔය අමුණෙන් රේණිඩ්දෙණිය කුඹුරුයායට ජලය ලබාගැනීම සඳහා රු.401,201 ක් වැය කර අඩි 245 ක කොන්ක්‍රීට් ඇළමාර්ගයක් ඉදිකර තිබුණු නමුත් එමඟින් යාය කෙළවරේ පිහිටි කුඹුරුවලට ජලය නොලැබෙන බව ක්ෂේත්‍ර පරීක්ෂණයේ නිරීක්ෂණය විය.

iii. කුඹුරු අක්කර 24 කට ජලය සැපයීම අරමුණු කරගෙන රු.612,466 ක වියදමින් කුඹල්ඔළුව ඇළ වැඩිදියුණු කර තිබුණද, ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් ඇළට නොලැබීම හේතුවෙන් 2013/14 මහ කන්නයේදී කුඹුරුයාය වගාකර නොතිබුණි.

iv. 2013 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,779,502 ක වියදමින් වාරි කර්මාන්ත 03 ක් සංවර්ධනය කර තිබුණු නමුත්, එම ඇළ මාර්ගවලින් ජලය ලබාගන්නා කුඹුරු අක්කර 79 ක් 2013/14 මහකන්නයේ වගාකර නොතිබුණි.

(ඇ) මධ්‍යම පළාත් සභා පරිපාලන සංකීර්ණයට විදුලි ජනන යන්ත්‍ර දෙකක් සපයා සවිකිරීම සඳහා 2012 වර්ෂයේ ප්‍රතිපාදනවලින් රු.31,297,567 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන 2013 ජනවාරි 28 දින ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණු නමුත් 2014 දෙසැම්බර් 31 දින වනවිටත් අදාල විදුලි ජනන යන්ත්‍ර දෙක සපයා සවිකර නොතිබුණි.

(ඈ) මුද්දර බදු ආදායම වශයෙන් 2012 වර්ෂයේදී රු.685,302,150 ක්ද, 2013 වර්ෂයේදී රු.862,749,671 ක්ද රැස්කර තිබුණද දිරිදීමනා ගෙවීම සඳහා මුද්දර ගාස්තු ආදායම සලකා තිබුණු නමුත්, 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ හෝ 1992 අංක 01 දරන සංශෝධිත ප්‍රඥප්තියේ හෝ දිරිදීමනා ගණනය කිරීම සඳහා මුද්දර ගාස්තු ආදායම් පාදක කර ගැනීමට ප්‍රතිපාදන සලසා නොතිබුණි. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2012 මුල් අර්ධ වර්ෂයේ තක්සේරු දැන්වීම මත අයකළ රු.34,050,469 ක බදු මුදල් හා රු.421,165,921 ක මුද්දර ගාස්තු ආදායම දෙවන අර්ධ වර්ෂයේ දිරිදීමනා ගෙවීම සඳහා පදනම් කරගෙන තිබුණි.

(ඉ) සේවා පහසුකම් අඩු ප්‍රදේශවල මාතෘ හා ළමා සෞඛ්‍ය ආශ්‍රිත රෝගාබාධ නිසා ඇති වන මරණ සංඛ්‍යාව අඩු කිරීම, එන්නත් හා ප්‍රතිශක්තිකරණය, සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම අදාළ ව්‍යාපෘතියේ අරමුණ වුවත්, එම අරමුණට බැහැරව යමින් අවස්ථා 03 කදී ඉදිකිරීම් හා මිලදී ගැනීම් සඳහා රු.2,880,141 ක වියදම් දරා තිබුණි.

(ඊ) පහත විස්තර දැක්වෙන අවස්ථාවලදී අධ්‍යාපන දෙපාර්තමේන්තුව සිය අරමුණුවලට අදාල කාර්යයන් වලින් බැහැරව ක්‍රියාකර තිබුණි.

i. වත්තේගම කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ ඇති පාසල් 14 ක් සඳහා 2013 ජූනි මාසයට අදාලව රු.744,473 ක් සහ ජූලි මාසයට අදාලව පාසල් 71 ක් සඳහා රු.2,535,646 ක් ආහාර සැපයුම්කරුවන්ට නොගෙවීම හේතුවෙන් ඔවුන් ආහාර සැපයීමෙන් ඉවත් වී තිබුණි.

ii. බැද්දේගම කණිෂ්ඨ විද්‍යාලයේ සිසුන් 151 දෙනෙකු සඳහා ගුරුභවතුන් 15 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර ඉන් දෙදෙනෙකු වෙනත් පාසලකට අනුයුක්ත කර තිබුණි. ඉතිරි ගුරුභවතුන් අතරින් එක් පාසල් දිනයකදී ගුරුභවතුන් 04 සිට 12 දක්වා ප්‍රමාණයක් නිවාඩු ලබා ඇති බැවින් පාසැලේ අධ්‍යාපන කටයුතු අඩාල වී තිබුණි.

(උ) 1994 ජූලි 01 දිනැති අංක 24/94 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සහ 2001 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව පළාත් සභාව විසින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

i. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 දෙසැම්බර් 26 දිනැති අංක එස්ජ්/ජීර්එස්/27 දරන ලිපියට අනුව 2013 වර්ෂයට අදාලව නොපියවා ඇති වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් සමඟ සියලුම හිඟ මුදල් 2013 දෙසැම්බර් 31 දිනට හෝ එදිනට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පියවිය යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දිනට පියවීමට තවදුරටත් ඉතිරිව තිබුණු දායක මුදල්වල එකතුව රු.1,859,547,432 ක් විය.

ii. ඉහත ඡේදයෙහි දැක්වෙන හිඟ මුදල් නිරවුල් කිරීමට කටයුතු නොකරන ලද නමුත්, පළාත් සභාව විසින් රාජ්‍ය බැංකු 2 ක ස්ථාවර තැන්පතුවල කර තිබුණු ආයෝජන සහ එමගින් උපයාගෙන තිබූ පොලී මුදල්වල එකතුව සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.940,220,286 ක් වී තිබුණි.

(ඌ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරියෙකුට 2011 ජනවාරි සිට 2013 සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී නිල වාහනය සඳහා ලබාදී තිබුණු අතිරේක ඉන්ධන (පෙට්‍රල්) ලීටර් 6,900න් රු.592,659 ක් වටිනා ඉන්ධන ලීටර් 4,131 ක් භාවිතා කළ ආකාරය තහවුරු කිරීමට අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. වාහනයේ ධාවනයන් පිළිබඳව දෛනික සටහන් ද විධිමත් පරිදි පවත්වා නොතිබුණි.

(එ) මධ්‍යම පළාත් මුල්‍ය රීති 164(අ) ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවී භාණ්ඩ ලැබීමට පෙර අවස්ථා 14 කදී ගෙවීම් වවුචර් පත් සහතික කර 2013 දෙසැම්බර් 31 දින රු.6,363,616 ක මුදලක් ගෙවා තිබුණි.

(ඒ) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ත්‍රෛමාසික ගොවි සවිය සඟරාවේ විශේෂ කලාපය මුද්‍රණය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 ඡේදය පරිදි විධිමත් ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් එකඟ වී තිබූ රු.712,500 ක මිල ඉක්මවා තවත් රු.274,200 ක් ගෙවීමට සිදුවී තිබුණි.

6.6 දෘෂ්‍ය අක්‍රමිකතා

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ද්විතීයික පාසැල් 1000 ක් හා ප්‍රාථමික පාසැල් 5000 ක් ප්‍රතිනිර්මාණය කිරීමේ ජාතික වැඩසටහන යටතේ ලැබුණු රු.400,000 ක මුදලින් රු.174,395 ක මුදලක් අයථා ලෙස ලක්ෂපාන මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් ලක්ෂපාන සමූපකාර ග්‍රාමීය බැංකුවේ පවත්වාගෙන යන ඔහුගේ පෞද්ගලික බැංකු ගිණුමට බැරකර ගෙන තිබුණි.

(ආ) වැසිකිලි කැසිකිලි පද්ධතියක් ඉදිකිරීම සඳහා අඹගමුව ප්‍රාදේශීය ලේකම් විසින් 2012 වර්ෂයේදී ලක්ෂපාන මධ්‍ය මහා විද්‍යාලයට රු.366,231 ක මුදලක් ලබාදී තිබුණි. මෙම මුදලින් රු.330,231 ක් හා රු.30,000 ක් වශයෙන් එකතුව රු.360,231 ක් වූ චෙක්පත් 2 ක් ලියා හිටපු විදුහල්පතිවරයා විසින් පළමු අත්සනද, නියෝජ්‍ය විදුහල්පතිවරයා විසින් දෙවන අත්සනද යොදා මහජන බැංකුවේ ගිණිගත්හේන ශාඛාවේ පවත්වා ගෙන යන හිටපු විදුහල්පතිවරයාගේ පෞද්ගලික ගිණුමට බැර කර තිබුණි.

## 6.7 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

---------------------------------------------------

අධ්‍යාපන, සෞඛ්‍ය හා ගරු ආණ්ඩුකාර තුමාගේ කාර්යාලවලට අයත් එකතුව 811 ක් වූ ඉඩම් ගොඩනැගිලි, වාහන, යන්ත්‍ර හා කාර්යාල උපකරණ වසර 1 සිට 15 දක්වා කාලයක් තිස්සේ නිශ්ක්‍රීයව පැවතුණි.

## 6.8 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මධ්‍යම පළාත් සභාවේ ගරු සභාපති හා උපසභාපති වෙත 2013 ඔක්තෝබර් 09 සිට 2014 ජනවාරි 09 දක්වා නිල නිවාස ලබාදීම වෙනුවෙන් පිළිවෙලින් රු.153,240 ක් හා රු.92,129 ක වියදම් දරා තිබුණද, ඔවුන් එම නිවාසවල පදිංචිය ආරම්භ කරන ලද බව තහවුරු නොවීය.

(ආ) පළාත් සභා සැසිවාරවලදී භාවිතා කරන සෙංකෝලය හොඳ තත්ත්වයෙන් තිබියදීත්, 2013 මැයි 31 දින රු.580,000 ක වියදමින් නව සෙංකෝලයක් සකස් කර තිබුණි.

(ඇ) කොළඹ වෛද්‍ය සැපයීම් අංශය මගින් 2013 වර්ෂයේදී මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත සපයන ලද ඖෂධ තොගවලින් රු.1,322,973 ක් වටිනා ඖෂධ ප්‍රමිතියෙන් තොර බවට තීරණය කිරීම නිසා මාතලේ ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයේ රඳවා තිබුණි. ඊට අමතරව ප්‍රාදේශීය කාර්යාලවලට නිකුත් කරන ලද තවත් ඖෂධ වර්ග 07 ක් දින 17 සිට දින 23 දක්වා කාලයක් ගතවීමෙන් අනතුරුව, ප්‍රමිතියෙන් තොර බවට තීරණය කර තිබුණි. එම අවස්ථාව වන විටත්, එකී ඖෂධ රෝහල්වලට නිකුත් කර තිබුණු බව දක්නට ලැබුණි.

(ඇ) මධ්‍යම පළාත් සමස්ථ සංචාරක සැලැස්මක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයට රු.2,300,000 ක් ගෙවා අවශ්‍ය සැලසුම් සකස් කරගෙන තිබුණද, එම සංචාරක සැලැස්ම 2013 වර්ෂයේදීත් ක්‍රියාත්මක කර නොතිබුණි.

6.9 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී වාහන අනතුරු දෙකක අළුත්වැඩියා සඳහා රු.334,433ක් වැයවී තිබුණු නමුත් රක්ෂණ හිමිකම් මඟින් ආවරණය වී තිබුණේ රු.232,123ක් පමණක් බැවින් රු.102,310ක අලාභයක් සිදුවී තිබුණි. අලාභය සම්බන්ධයෙන් මුල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සිදුවී තිබුණු අලාභ හානිවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට රු.1,915,518 ක අලාභ ශේෂයක් පැවැති අතර, එම ශේෂයට ඇතුළත්ව තිබුණු රු.1,832,157 ක ශේෂ 2004 වර්ෂයටත් පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින බව අනාවරණය විය.

(ඇ) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පේෂකර්ම මධ්‍යස්ථාන වෙත ලබා දෙන නූල්, ඩයි, අමු රෙදි හා රසායනික ද්‍රව්‍ය තොග වංචා කිරීම හෝ සොරකම් කිරීම හේතුවෙන් එකතුව රු.1,442,665ක් වූ අලාභ සිදු වී තිබුණි. එම අලාභ සිදු වී වසර 08ක කාලයක් ගත වී තිබුණු නමුත් මුල්‍ය රීති 54 ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඈ) මධ්‍යම පළාත් සභාවට අයත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල වාහන අනතුරු සම්බන්ධයෙන් අවස්ථා 03 කට අදාළ නොවිසඳී පවතින රු.304,862 ක හානි සහ අවස්ථා 11 කට අදාලව රු.31,834,853 ක දේපල හානි ඇතුළු මුළු හානිවල එකතුව රු.32,139,715 ක් විය. තවත් අවස්ථා 04 කට අදාල දේපල හානිවල වටිනාකම ගණනය කර නොතිබුණි. වසර ගණනාවක් ගතවී ඇති මෙම වාහන සහ දේපල හානි නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

6.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඩිසයිඩ් දෙමළ විද්‍යාලයේ අලුත්වැඩියාව - රු.654,617
--------------------------------------------------------------

දිග අඩි 60ක් හා පළල අඩි 20ක් වූ ගොඩනැගිල්ල
---------------------------------------------------------

i. වර්ග මීටර් 172.65ක පන්ති කාමරවල තීන්ත ආලේප කිරීම සඳහා රු.22,444ක මුදලක් ගෙවා තිබුණ නමුත්, නියමිත ප්‍රමිතියෙන් යුතුව තීන්ත ආලේප කර නොතිබුණි.

ii. දොරවල් 03ක් සවිකිරිම වෙනුවෙන් වර්ග මිටර් 8.81ක් සඳහා රු.38,764ක මුදලක් ගෙවා තිබුණු නමුත්, දොරවල් සියල්ලෙහි දොර අගුලු කැඩී ගොස් තිබුණි.

දිග අඩි 40ක් හා පළල අඩි 20ක් වූ ගොඩනැගිල්ල
-------------------------------------------------------

තින්ත ආලේප කිරීම සඳහා වර්ග මීටර් 138.30ක් වෙනුවෙන් රු.17,979ක මුදලක් ගෙවා තිබුණු නමුත්, තීන්ත ආලේප කිරීම නිසි පරිදි ඉටු කර නොතිබුණි.

(ආ) ඉන්වරි දෙමළ විද්‍යාලය - රු.547,268
------------------------------------------

i. නියමිත ඝනකමට වඩා අඩු ඝනකමින් යුත් යකඩ දොරවල් 03ක් යෙදීම සඳහා වර්ග මිටර් 5.83ක් වෙනුවෙන් රු.55,385ක මුදලක් ගෙවා තිබුණි.

ii. ඇස්තමේන්තු සීමාව ඉක්මවා පොළව කොන්ක්‍රීට් කිරීම සඳහා වර්ග මීටර් 35ක් වෙනුවෙන් රු.37,800ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) හැඩ්ලි දෙමළ විද්‍යාලය ඉදි කිරිම - රු.547,268
------------------------------------------------------

නියමිත ඝනකමට වඩා අඩු ඝනකමින් යුත් යකඩ දොරවල් 02ක් යෙදීම සඳහා වර්ග මිටර් 4.4ක් වෙනුවෙන් රු.39,330ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) වැලිඔය දෙමළ විද්‍යාලය - රු.537,369

-------------------------------------------

i. බිම පොළව සිමෙන්ති දැමීම වෙනුවෙන් වර්ග මීටර් 156.44ක් සඳහා රු.89,170ක මුදලක් ගෙවා තිබුණු නමුත්, නියමිත මිශ්‍රණයෙන් තොරව පොලොව සිමෙන්ති දැමීම නිසා වර්ග මිටර් 69.6ක ප්‍රමාණයක් බොල් වී කැඩී යමින් පැවතුණි.

ii. ස්ලයිඩින්(Sliding window) ජනේලයක් සවි කිරිම වෙනුවෙන් වර්ග මිටර් 12.96ක් සඳහා රු.106,931ක මුදලක් ගෙවා තිබුණු නමුත්, එහි ආරක්ෂාව සඳහා ඇතුළත යකඩ ග්‍රීල් සවි කර නොතිබුණි.

iii. ගොඩනැගිල්ලට පිවිසෙන පඩිපෙළ කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් කියුබ් 4.9ක් සඳහා රු.51,131ක මුදලක් ගෙවා තිබුණු නමුත්, ඒ සඳහා යොදා තිබුණේ කොන්ක්‍රීට් කියුබ් 2.32ක පමණක් බැවින්, කොන්ක්‍රීට් කියුබ් 2.58ක් සඳහා රු.24,209ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) නාමගල් දෙමළ විද්‍යාලයේ දිග අඩි 90ක් හා පළල අඩි 25ක් වූ ගොඩනැගිල්ල දෙවන අදියර ඉදි කිරීම

------------------------------------------------------------------------------------

i. විදුලි පද්ධතිය සඳහා සවිකළ ක්‍රියා විරහිතව තිබූ ස්විචයක් සඳහාද රු.54,145 ක මුදලක් ගෙවා තිබුණි.

ii. 1:3 මිශ්‍රණයෙන් පොළවේ සිමෙන්ති යෙදීම සඳහා වර්ග මිටර් 201.74ක් වෙනුවෙන් රු.97,843ක මුදලක් ගෙවා තිබුණු නමුත්, ඉන් වර්ග මීටර් 77.2ක් සම්පූර්ණයෙන්ම බොල් වී පුපුරා ගොස් තිබුණි.

(ඊ) පේරාදෙණිය දෙමළ විද්‍යාලය අලුත්වැඩියාව - රු.547,268

--------------------------------------------------------------

ගුරු නිවාසයේ කානුව 1:2:5:5 මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් කිරීම සඳහා ඝන මීටර් 1.13ක් සඳහා රු.15,209ක මුදලක් ගෙවා තිබුණද, ඒ සඳහා යොදා තිබුණේ ඝන මීටර් 0.232ක් පමණක් හෙයින් ඝන මීටර් 0.898ක් සඳහා රු.12,081ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

6.11 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කොත්මලේ කොහොල්දෙණිය බූට් වේල්ල ඇළ අලුත්වැඩියා කිරීම සඳහා 2013 ජූලි 03 දින වාරිමාර්ග ඉංජිනේරු විසින් ගොවි සංවිධානයක් සමඟ ඇති කරගත් ගිවිසුම අනුව කර්මාන්තය 2013 නොවැම්බර් 05 දිනට අවසන් කළයුතුව තිබුණි. එහෙත් නියමිත පරිදි වැඩ අවසන්කර නොතිබුණු අතර 2014 මාර්තු 31 දිනට නිමකර තිබුණේ අදාල වැඩවලින් සියයට 26 ක ප්‍රමාණයක් පමණකි.

(ආ) ඩන්සිනන් පූඩළුඔය මාර්ගය

--------------------------------

i. 2013 පෙබරවාරි 17 දිනට නිම කළ යුතුව තිබුණු රු.4,485,940 ක් පිරිවැය වූ මෙම කාර්මාන්තය මාස 07 ක ප්‍රමාදයක් සහිතව නිම කර තිබුණි.

ii. පළමු තාර ආලේපනය යෙදීමෙන් දින 28 ක් ඇතුළත දෙවන වර තාර ආලේපනය කළයුතු වුවත්, එය මාස 03 ක් ගතවන තුරු සිදු නොකිරීම හේතුවෙන් මාර්ග තලයේ වැඩි ප්‍රමාණයක් පලුදු වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහඔය දේවහන්දිය පාලම ඉදි කිරීමේ කර්මාන්තය නිම කළයුතු කාලය ඉක්මවා මාස 06 කට අධික කාලයක් ගත වී තිබුණ නමුත් කර්මාන්තයේ කටයුතු නිම කර නොතිබුණි. අධිකාරියේ පාලනය යටතේ නොපවතින මෙම මාර්ගය හරහා ඇති කුඩා ජල ප්‍රවාහයක් සහිත ඇල මාර්ගය වෙනුවෙන් පාලමක් ඉදි කිරීම අධිකාරියට අයත් නොවන කාර්යයක් වුවද, ඒ වෙනුවෙන් රු.12,157,885 ක වියදමක් අධිකාරිය විසින් දරා තිබුණි.

(ඈ) ඇස්තමේන්තු පිරිවැය රු.3,003,001 ක් වූ නෝටන් හෝමාගම මාර්ගය ඉදි කිරීමේ කර්මාන්තයේ කටයුතු නිම කිරීම මාස 10 කට අධික කාලයක් ප්‍රමාද වී තිබුණි. මෙම කර්මාන්තයේ පළමු වර තාර ආලේපනය සිදු කර මාස 07 ක කාලයක් ගත වී තිබුණ නමුත්, දෙවන වර තාර ආලේපනය නොකිරීම හේතුවෙන් මාර්ග තලය සම්පූර්ණයෙන්ම පලුදු වී ගොස් තිබුණි.

## 6.12 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය. (ගුරු හා විදුහල්පති සේවය හැර)

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 2,036 | 1,610 | 426 | - |
| තෘතීයික මට්ටම | 913 | 726 | 187 | - |
| ද්විතීයික මට්ටම | 8,676 | 6,200 | 2,476 | - |
| ප්‍රාථමික මට්ටම | 4,678 | 3,358 | 1,320 | - |
| වෙනත් (අනියම්, තාවකාලික) | 23 | 701 | - | 678 |
| | 16,326 | 12,595 | 4,409 | 678 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

i. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා වෙනත් සේවකයින් 678 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබූ අතර පුරප්පාඩු 4,409 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

ii. පේෂකර්ම දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 76ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

iii. පේෂකර්ම දෙපාර්තමේන්තුවේ බඳවාගෙන තිබුණු 96 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට ආයතනය විසින් කටයුතු කර තිබුණි.

iv. කර්මාන්ත දෙපාර්තමේන්තුවේ උපදේශක තනතුරු 47කින් තනතුරු 15ක් සහ ආයතනයේ පරිපාලන තනතුර පුරප්පාඩු වී පැවතීම නිසා එය ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි සෘජුව බලපා තිබුණි.

(ආ) පාසල් කාර්ය මණ්ඩල විස්තර

2013 දෙසැම්බර් 31 දිනට විදුහල්පති සේවයේ හා ගුරු සේවයේ සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පති | 1717 | 1570 | 147 | - |
| ගුරු සේවය | 25,084 | 26,941 | - | 1,857 |
| සුළු සේවක | 2,046 | 607 | 1,439 | - |
| වෙනත් | 249 | 28 | 221 | - |
| | 29,096 | 29,146 | 1,807 | 1,857 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විදුහල්පති ශ්‍රේණිධාරීන් 147 ක පුරප්පාඩු තිබියදීත් දැනට සිටින විදුහල්පති ශ්‍රේණිධාරීන් විදුහල්පති රාජකාරි වලින් බැහැර රාජකාරි සඳහා යොදවා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පැවති සුළුසේවක සහ වෙනත් සේවාවල පුරප්පාඩු 1,807 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(iii) බඳවාගෙන තිබුණු අතිරික්ත ගුරුභවතුන් 1857 දෙනා සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) කලාප අධ්‍යාපන කාර්යාල 15 ට අදාල පාසැල් 1499 හි කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් අනුමත ගුරුභවතුන් සංඛ්‍යාව හා තථ්‍ය සංඛ්‍යා සැසඳීමේදී කලාප කාර්යාල 09 ක ගුරුභවතුන් 1312 ක පුරප්පාඩු පැවති අතර කලාප කාර්යාල 06 ක අනුමත සංඛ්‍යාව ඉක්මවා ගුරුභවතුන් 3169 ක් සේවයේ යොදවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

* කලාප අධ්‍යාපන කාර්යාල 09 හි පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට ආසන්න ගුරු අතිරික්තයක් ඉතිරි කලාප කාර්යාල 06 හි පවතින බව නිරීක්ෂණය විය.

* පළාත තුළ ඇති කලාප කාර්යාල 15 හි පවතින ගුරු පුරප්පාඩු සහ ගුරු අතිරික්තතා එකිනෙක ගැලපීම මඟින් විසඳා ගැනීමේ හැකියාව පැවතියද ඒ කෙරෙහි අවධානය යොමු කර ඇති බව දක්නට නොලැබුණි.

(ඈ) නිශ්කාර්ය මානව සම්පත්
----------------------------

(i) කටුගස්තොට කලාප කාර්යාලයට අයත් සිසුන් 19 දෙනෙකු ඉගෙනුම ලබන නියංගොඩ කණිෂ්ඨ විද්‍යාලය සඳහා ගුරුභවතුන් 8 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. පළමු හා දෙවැනි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත්ව නොතිබුණි.

(ii) සිසුන් 22 දෙනෙකු ඉගෙනුම ලබන හරංකහව මහා විද්‍යාලයට ගුරුභවතුන් 15 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. එම පාසලේ 1, 2, 4 සහ 5 යන ශ්‍රේණිවලට සිසුන් ඇතුළත්ව නොතිබුණි.

මෙම අතිරික්ත ගුරුවරුන් වෙනත් පාසල් වෙත යොමු කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(iii) ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ ගුරුභවතුන් හතර දෙනෙකුගෙන් කිසිදු සේවයක් ලබා නොගෙන වැටුප් හා දීමනා ගෙවමින් පැවතුණි.

(ඇ) වෙනත්
---------

වත්තේගම අධ්‍යාපන කලාපයේ පිහිටි අභිරාම් දෙමළ විදුහලේ විදුහල්පති විසින් 2010 වර්ෂයේදී දින 117 ක්, 2011 වර්ෂයේදී දින 76 ක් හා 2012 වර්ෂයේදී දින 101 ක්ද නිවාඩු ලබාගෙන තිබුණි. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාටද මේ පිළිබඳව වාර්තා කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර විනය ක්‍රියා මාර්ග නොගෙන 2013 ජූනි 03 දින සිට තාක්ෂණ විෂය සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ද්‍රවිඩ අංශයට ඔහු අනුයුක්ත කර තිබුණි.

7. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය
------------------------------------------

7.1 සංයුක්ත සැලැස්ම
--------------------

සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබුණු උපාය මාර්ගික සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. ඉදිකිරීම් සඳහා අදාළ නියමිත ස්ථාන හඳුනාගැනීම, ඉඩම් වෙන් කරවා ගැනීම වැනි මූලික කටයුතු හෝ සිදුකර නොතිබුණි.

7.2 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවද දෙපාර්තමේන්තු 03 ක් හා මගී ප්‍රවාහන සේවා අධිකාරිය සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත්, පිළියෙල කර නොතිබුණි.

7.3 අභ්‍යන්තර විගණනය
-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 11 ක අභ්‍යන්තර විගණනය ඒකක පිහිටුවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු 02 ක් තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

7.4 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තු හා ආයතන 06 ක් විසින් 2013 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

(ආ) කාර්තු පදනමින් වර්ෂයක් සඳහා අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රැස්වීම් 03 ක් පමණක් පවත්වා නොතිබුණි.

7.5 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ආයතන දෙකක් විසින් 2013 දෙසැම්බර් 31 දින වන විටත් සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් 2013 වර්ෂය සඳහා ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන්ගෙන් බැහැරව යමින් නුවරඑළිය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් රු.344,250 ක් වටිනාකමැති පරිගණක 5 ක් හා ප්‍රින්ටර් 3 ක් මිලදී ගෙන තිබුණු අතර, අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර අදාළ මිලදී ගැනීම නිසා වැඩිපුර රු.26,250 කදී ගෙවීමට සිදුවී තිබුණි.

7.6 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශ 2 ක් සහ එක් දෙපාර්තමේන්තුවක් විසින් අදාළ වැය විෂයයන් යටතේ ගිණුම්ගත නොකර එකතුව රු.1,004,290 ක් වූ වියදම් වෙනත් වැය විෂයයන් 09 ක් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) පේෂකර්ම දෙපාර්තමේන්තුව පළාත් මුල්‍ය රීති 30.1 හි නියමයන්ට අනුකූල නොවී ප්‍රතිපාදන අපේක්ෂාවෙන් වැය විෂයයක රු.640,434ක වියදම් දරා තිබුණි.

(ඇ) විදුලිබල අමාත්‍යාංශය විසින් පුනරාවර්තන වැය විෂයයන්වල ප්‍රතිපාදන උපයෝගී කරගෙන රු.209,124 ක ස්ථාවර වත්කම් මිලදීගෙන තිබුණි.

7.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාවේ දිනය | සභාගත කළ දිනය |
|---|---|---|
| 2009 | 2010.08.17 | 2010.09.07 |
| 2010 | 2011.12.30 | 2012.02.06 |
| 2011 | 2013.03.28 | 2013.04.23 |
| 2012 | 2014.07.04 | 2014.08.19 |

8. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඈ) පළාත් සභා සංවර්ධන සැලැස්ම

(ඉ) සේවක මණ්ඩල කළමනාකරණය

ආදායම් (රුපියල් මිලියනවලින්)

| | 2013 | | | 2012 | | | 2011 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත |
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| පළාත් සභා විෂයන්ට අදාල ආදායම් | | | | | | | | | | |
| බදු ආදායම් | 4,790 | 3,840 | 950 | 4,612 | 3,853 | 759 | 3,325 | 3,685 | (360) | 3,032 |
| බදු නොවන ආදායම් | 471 | 701 | (230) | 428 | 1,002 | (574) | 325 | 941 | (616) | 348 |
| | 5,261 | 4,541 | 720 | 5,040 | 4,855 | 185 | 3,650 | 4,626 | (976) | 3,380 |
| රජයේ ප්‍රදාන | 19,832 | 18,522 | 1,310 | 17,311 | 15,532 | 1,779 | 17,948 | 16,029 | 1,919 | 16,087 |
| | 25,093 | 23,063 | 2,030 | 22,351 | 20,387 | 1,964 | 21,598 | 20,655 | 943 | 19,467 |

## වියදම් (රුපියල් මිලියනවලින්)

| | 2013 | | | 2012 | | | 2011 | | | 2 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත |
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| **පුනරාවර්තන වියදම්** | | | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 416,693 | 16,020 | 691 | 15,157 | 14,752 | 405 | 14,156 | 14,128 | 28 | 12,962 |
| අනෙකුත් | 4,251 | 4,008 | 243 | 3,982 | 3,248 | 734 | 2,871 | 2,799 | 72 | 3,298 |
| උප එකතුව | 20,944 | 20,010 | 934 | 19,139 | 18,000 | 1,139 | 17,027 | 16,927 | 100 | 16,260 |
| ප්‍රාග්ධන වියදම් | 4,490 | 3,282 | 1,208 | 3,764 | 3,162 | 602 | 4,571 | 2,614 | 1,957 | 3,618 |
| එකතුව | 25,434 | 23,292 | 2,142 | 22,903 | 21,162 | 1,741 | 21,598 | 19,541 | 2,057 | 19,878 |